
KIDS GOD WORSHIP
www.kidworship.kr

# ආදම් සහ ඒව


– 2nd Story–



10Page



11Page



12Page

**පොතේ ගුරා** එදන් උයනේ සියලු වර්ගවල ගස් සහ මල් වර්ග ද අලංකාර ගංගාවන් ද ගලායමින් තිබුණේය. සෑම සත්වයෙක්ම සතුටින් ප්‍රීතියෙන් ජීවත් වුණා. නමුත් ඒ උයනේ මැද යහපත සහ නපුර දැනගැනීමේ ගස තිබුණේය. ආදම් ප්‍රීතියෙන් ඒදන් උයන තුළ ජීවත් වූ අතර දෙවියන්වහන්සේ ඔහු සමඟ කතා කළ සේක.

**දෙවියන්වහන්සෙ** ඔබට උයනේ ගස්වලින් කැමති කැමති ලෙස ගෙඩි කන්න පුළුවන්.
නමුත්, යහපත සහ නපුර දැනගැනීමේ ගහෙන් කන්ට එපා.
මන්ද එයින් කෑ දවසේ ඒකාන්තයෙන්ම ඔබ මැරෙන්නේ ය.

**ආදම්** ඔව් ! ස්වාමිනි.

...........................................................................................

**පොතේ ගුරා** දෙවියන්වහන්සේ, ආදම් තනිව සිටීම සුදුසු නැතිබව දුටු සේක. ආදම් නින්දට පත් වෙලාවේ, දෙවියන්වහන්සේ ඔහුගෙන් ගත් ඉල ඇටයෙන ්ස්ත්‍රිය සෑදූ සේක. ස්ත්‍රියගේ නම ඒව.
ආදම් සහ ඒව නිර්වස්ත්‍රව සිටි නමුත් ඔවුන් ලැජ්ජා වූයේ නැත.

...........................................................................................

**පොතේ ගුරා** එක් දවසක දී සර්පයා ඒවා ඉදිරියට පැමිණියේ ය.

**සර්පයා** ඇත්තටම, දෙවියන්වහන්සේ කීවද ?
උයනේ කොයි ගසකින්වත් ගෙඩි කන්නට එපාය කියා ?

**ඒව** නෑ. උයනේ ගස්වල ගෙඩි කන්නට අපට පුලුවන.
ඒත් උයන මැද තිබෙන යහපත හා නපුර දැන ගැනීමේ ගහෙන් ගෙඩි කන්නටවත් ඊට අතගසන්නටවත් එපා.
එයින් කන දවසේ අපි මැරෙන බව දෙවියන්වහන්සේ කී සේක.

**සර්පයා** නෑ. ඇත්තට ඔබලා මැරෙන්නේ නෑ. ඒ නිසා උත්සහ කරල බලන්න.
එයින් කන දවසේ ඔබගේ ඇස් ඇරෙන බවත්, යහපත හා නපුර දැනගෙන, දෙවියන්වහන්සේට සමාන වන බවත් දෙවියන්වහන්සේ දන්නේය.

**ඒව** ආහ්. ඇත්ත ද ? ඒක ඇත්තක් ද ?

**සර්පයා** ඇත්තටම ඇත්ත.
ඒ එල කොයිතරම් රසයිද කියා බලන්න. හී... හී... හී...

**පොතේ ගුරා** ආදම් සහ ඒවට දුන් පොරොන්දුව කඩන්නටත්,
ඔවුන් උන්වහන්සේට විරුද්ධව පව් කරන්නටත් සැලැස්වීම සර්පයාගේ අරමුණ වුණා. පසුව ඒව වනාහි ඒ ගහ කෑම හොඳ බව ද එය ඇස් වලට ප්‍රිය බව ද, නුවණ ලැබීමට හොඳ ගහක් බව ද දුටුවේය.
දෙවියන්වහන්සේගේ අනතුරු ඇඟවීම සම්පූර්ණයෙන්ම අමතකව අනි-වාර්යයෙන්ම මැරෙන බවත් අමතක වී, එහි ගෙඩි ගෙන කෑවාය.
තමාගේ පුරුෂයාටත් දුන්නේය. ඔහු ද කෑවේය. එවිට අමුතු දෙයක් සිදු



14Page

පොතේ ගුරා — ඔවුන් නිර්වස්ත්‍රව සිටි බව දැක, ලැජ්ජා වී අත්තික්කා කොළ මසා තමන්ට ඉණ වැසුම් සාදා ගත්තේය.

ඉන් පසුව ඔවුන් උයනේ සැඟවුණෝය. මේ සියල්ල දුටු දෙවියන්වහන්සේ දුකට පත් වී ආදම්ට කතා කළ සේක.

දෙවියන්වහන්සෙ — ආදම් ඔබ කොහේ ද ? නොකන්ට අණ කළ ගහෙන් කෑවා ද ?


ඇදම් — දෙවියන්වහන්ස, ඒව මට දුන්නා. ඒ නිසා මම කෑවා.

දෙවියන්වහන්සෙ — ඒව, ඇයි ඔයා මෙහෙම කළේ ?

ඒව — ස්වාමිනි, සර්පයා මාව රැවැට්ටුවා.

පොතේ ගුරා — දෙවියන්වහන්සේ ආදම් සහ ඒවට දඬුවම් දුන්නා සේම සර්පයාටත් දඬුවම් කළ සේක.

..........................................................................................



15Page

දෙවියන්වහන්සේ — සර්පයා නුඹ මේක කළ බැවින් නුඹේ ජීවිතයේ සියලු දවස්වල බඩගා යමින් දූවිල්ල කන්නේය. ස්ත්‍රිය නුඹ වේදනා සහිතව දරුවන් වදන්නීය. ආදම් අමාරුකමෙන් පොළොවෙන් දේවල් උපද වන්නේ ය.

නුඹ මැරෙන විට දූවිල්ලටම හැරී යන්නේය.

පොතේ ගුරා — දෙවියන්වහන්සේ ආදම් සහ ඒවට සම්වලින් ඇඳුම් සාදා ඇන්ද වූ සේක. දෙවියන්වහන්සේ ඔවුන්ට ප්‍රේම කළ සේක. අන්තිම දක්වාම ඔවුන් සමග සිටි සේක. ආදම් සහ ඒව ඒදන් උයනෙන් පිට කළ සේක.

ඔවුන් මැරෙන විට ඔවුන් නැවත දූවිල්ලටම හැරී ගියා උන්වහන්සේ කියපු ආකාරයෙන්ම.

..........................................................................................

**ජීවිතයට අදාළ කිරීම**

දුවේ පුතේ, ලෝකය පවතින්න නම් ලස්සන නීති තියෙන්න ඕන.

මැවුම්කාර දෙවියන්වහන්සේ දුන්න දේවනීතිය මිනිසා විසින් කැඩුවා.

නීති කැඩුවාම දඬුවම් ලැබෙනවා නේද?

ඒ නිසා දේව නීති අපි ආරක්ෂා කරමු.